# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2169/2 - 2020 මාර්තු මස 31 වැනි අඟහරුවාදා - 2020.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ.

### ජනාධිපති විධානය

ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම.

1. ඩී. එම්. ඒ. ආර්. බී. දිසානායක මැතිතුමා
   ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

2. එන්. එච්. එම්. චිත්‍රානන්ද මැතිතුමා
   ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

3. ඩී. එම්. එස්. අබේගුණවර්ධන මැතිතුමා
   ලේකම්, නිපුනතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

4. මහාචාර්ය සම්පත් අමරතුංග මැතිතුමා
   සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

5. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජේරත්න මැතිණිය
   උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය

6. මහාචාර්ය යූ. බී. දිසානායක මැතිතුමා
   උපකුලපති - පේරාදෙනිය විශ්වවිද්‍යාලය

7. මහාචාර්ය සුදන්ත ලියනගේ මැතිතුමා
   වැඩබලන උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය


1A - G 32210 — 32 (2020/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

8. මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා
   වැඩබලන උපකුලපති, කැළණිය විශ්වවිද්‍යාලය

9. මහාචාර්ය කේ. කේ. සී. කේ. පෙරේරා මැතිතුමා
   උපකුලපති, මොරටුව විශ්වවිද්‍යාලය

10. මහාචාර්ය කේ. කන්දසාමි මැතිතුමා
    වැඩබලන උපකුලපති, යාපනය විශ්වවිද්‍යාලය

11. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී. එස්. ඩී. අමරසේන මැතිතුමා
    උපකුලපති, රුහුණු විශ්වවිද්‍යාලය

12. මහාචාර්ය එස්. ඒ. අරියදුරෙයි මැතිතුමා
    උපකුලපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

13. මහාචාර්ය එෆ්. සී. රේගල් මැතිතුමා
    උපකුලපති, නැගෙනහිර විශ්වවිද්‍යාලය

14. මහාචාර්ය එම්. එම්.එම්. නජීම් මැතිතුමා
    උපකුලපති, අග්නිදිග විශ්වවිද්‍යාලය

15. ආචාර්ය බී. ඒ. කරුණාරත්න මැතිතුමා
    උපකුලපති, රජරට විශ්වවිද්‍යාලය

16. මහාචාර්ය සුනිල් ශාන්ත මැතිතුමා
    උපකුලපති, සබරගමුව විශ්වවිද්‍යාලය

17. මහාචාර්ය ඊ. එම්. පී. ඒකනායක මැතිතුමා
    උපකුලපති, වයඹ විශ්වවිද්‍යාලය

18. ආචාර්ය ජේ. එල්. රත්නසේකර මැතිතුමා
    වැඩබලන උපකුලපති, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

19. මහාචාර්ය ඩබ්. එම්. අබේරත්න බණ්ඩාර මැතිතුමා
    නිසි බලධාරි, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

20. ගරු මාර්ක් බිලිමෝරා පියතුමා
    විදුහල්පති, ශාන්ත තෝමස් විද්‍යාලය, ගල්කිස්ස

21. ගරු ඇලෙක්සැන්ඩ්‍රා මෙන්ඩිස් කන්‍යා සොයුරිය
    විදුහල්පති, ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07

22. එස්. එම්. කීර්තිරත්න මැතිතුමා
    විදුහල්පති, ආනන්ද විද්‍යාලය, කොළඹ 10

23. සඳමාලි අවිරුප්පොල මැතිණිය
    විදුහල්පතිනිය, විශාඛා විද්‍යාලය, කොළඹ 05

24. ඩබ්. එම්. ඩී. ටී. පී. වනසිංහ මැතිතුමා
    විදුහල්පති, ධර්මරාජ විද්‍යාලය, මහනුවර

25. එෆ්. වෙලේගේ මැතිතුමා
විදුහල්පති, රාහුල විද්‍යාලය, මාතර

26. වෛද්‍ය හර්ෂ අලස් මැතිතුමා
සභාපති, ගේට්වේ පාසල් සමූහය

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අධ්‍යාපන ක්ෂේත්‍රයන් කාලීන අවශ්‍යතාවයන්ට උචිතවන සේ නවීකරණය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇති හෙයින් ද තව ද මේ වනවිට උද්ගත වී ඇති කොරෝනා වසංගත තත්ත්වයන් හමුවේ අධ්‍යාපන ක්ෂේත්‍රය කිසිදු අයුරකින් පසුබෑමකට ලක්නොවී අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමේ ක්‍රමවේදයන් යොදා ගැනීමේ අවශ්‍යතාවය අවධානයට ලක්කරමින් ද,

1. ඩී. එම්. ඒ. ආර්. බී. දිසානායක මැතිතුමා
ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

2. එන්. එච්. එම්. චිත්‍රානන්ද මැතිතුමා
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

3. ඩී. එම්. එස්. අබේගුණවර්ධන මැතිතුමා
ලේකම්, නිපුනතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

4. මහාචාර්ය සම්පත් අමරතුංග මැතිතුමා
සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

5. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජේරත්න මැතිණිය
උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය

6. මහාචාර්ය යූ. බී. දිසානායක මැතිතුමා
උපකුලපති - පේරාදෙනිය විශ්වවිද්‍යාලය

7. මහාචාර්ය සුදන්ත ලියනගේ මැතිතුමා
වැඩබලන උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

8. මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා
වැඩබලන උපකුලපති, කැළණිය විශ්වවිද්‍යාලය

9. මහාචාර්ය කේ. කේ. සී. කේ. පෙරේරා මැතිතුමා
උපකුලපති, මොරටුව විශ්වවිද්‍යාලය

10. මහාචාර්ය කේ. කන්දසාමි මැතිතුමා
වැඩබලන උපකුලපති, යාපනය විශ්වවිද්‍යාලය

11. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී. එස්. ඩී. අමරසේන මැතිතුමා
උපකුලපති, රුහුණු විශ්වවිද්‍යාලය

12. මහාචාර්ය එස්. ඒ. අරියදුරෙයි මැතිතුමා
උපකුලපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

13. මහාචාර්ය එෆ්. සී. රේගල් මැතිතුමා
උපකුලපති, නැගෙනහිර විශ්වවිද්‍යාලය

14. මහාචාර්ය එම්. එම්. එම්. නජීම් මැතිතුමා
උපකුලපති, අග්නිදිග විශ්වවිද්‍යාලය

15. ආචාර්ය බී. ඒ. කරුණාරත්න මැතිතුමා
උපකුලපති, රජරට විශ්වවිද්‍යාලය

16. මහාචාර්ය සුනිල් ශාන්ත මැතිතුමා
උපකුලපති, සබරගමුව විශ්වවිද්‍යාලය

17. මහාචාර්ය ඊ. එම්. පී. ඒකනායක මැතිතුමා
උපකුලපති, වයඹ විශ්වවිද්‍යාලය

18. ආචාර්ය ජේ. එල්. රත්නසේකර මැතිතුමා
වැඩබලන උපකුලපති, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

19. මහාචාර්ය ඩබ්. එම්. අබේරත්න බණ්ඩාර මැතිතුමා
නිසි බලධාරි, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

20. ගරු මාර්ක් බිලිමෝරා පියතුමා
විදුහල්පති, ශාන්ත තෝමස් විද්‍යාලය, ගල්කිස්ස

21. ගරු ඇලෙක්සැන්ඩ්‍රා මෙන්ඩිස් කන්‍යා සොයුරිය
විදුහල්පති, ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07

22. එස්. එම්. කීර්තිරත්න මැතිතුමා
විදුහල්පති, ආනන්ද විද්‍යාලය, කොළඹ 10

23. සඳමාලි අවිරුප්පොල මැතිණිය
විදුහල්පතිනිය, විශාඛා විද්‍යාලය, කොළඹ 05

24. ඩබ්. එම්. ඩී. ටී. පී. වනසිංහ මැතිතුමා
විදුහල්පති, ධර්මරාජ විද්‍යාලය, මහනුවර

25. එෆ්. වෙලේගේ මැතිතුමා
විදුහල්පති, රාහුල විද්‍යාලය, මාතර

26. වෛද්‍ය හර්ෂ අලස් මැතිතුමා
සභාපති, ගේට්වේ පාසල් සමූහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්දර ගෝඨාභය රාජපක්ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත ඔබතුමන්ලා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

1. ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමට මෑතක දී බාධාවන් සිදුවීම හේතුවෙන් අතපසු වූ කාර්යයන් නිමා කොට අධ්‍යාපනය ලබන සිසුන්ගේ විභාග කටයුතු හා විෂය නිර්දේශ නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම,

2. මෙම කාලය තුළ දුරස්ථ අධ්‍යාපන සංකල්පය යටතේ සිසුන්ගේ අධ්‍යාපන ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ක්‍රමෝපායන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම,

3. වෘත්තීය හා නිපුණතා අධ්‍යාපන අවස්ථාවන් පුළුල් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනාගෙන එමගින් රැකියා වෙළෙඳපල වෙත යොමු කළ හැකි නිපුණතා කුසලතා වැඩි දියුණු කිරීමට නිර්මාණශීලී ක්‍රමවේදයන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම,

4. විශ්වවිද්‍යාලවලට නව බඳවා ගැනීම් කඩිනම් කර එම සිසුන්ට ද දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කරමින් එමගින් උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම,

5. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහළ නංවමින් සහ සිසුන් කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන විෂයන් වෙත යොමුවන අධ්‍යාපන ක්‍රම ඇතුළු වෙනත් පුහුණු වැඩ පිළිවෙල හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.

තව ද, ඩී. එම්. ඒ. ආර්. බී. දිසානායක මැතිතුමා, ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය හා එන්. එච්. එම්. චිත්‍රානන්ද මැතිතුමා, ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය පූර්වෝක්ත කාර්ය සාධක බලකායේ සම සභාපතිවරුන් ලෙස පත් කරමි.

තව ද, මෙම බලකායේ ලේකම් වශයෙන් උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් දීපා ලියනගේ මහත්මිය පත් කරමි.

තව ද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටු කරලීමට අදාළව අවශ්‍ය පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට උක්ත ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තව ද, පෙර කී බලකායේ සාමාජිකයින් වන ඔබ කලින් කලට මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් බලය පවරමි.

තව ද, මෙම ජනාධිපති කාර්ය සාධක බලකාය වෙතින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා සෙසු තැනැත්තන්ට තත් කාර්ය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියා කළ යුතු යැයි ද, ලබා දිය යුතු සියලුම සහාය සැලසිය යුතු යැයි ද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම නිලධරයන්ට හා සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තව ද, කිසියම් රාජ්‍ය සේවකයකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියකු විසින් පෙර කී කාර්ය සාධක බලකාය විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම ප්‍රමාද කරන හා පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙර කී කාර්ය සාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ මාර්තු මස 31 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.